## ගමන
ජනක කුඹුකගේ

ලැජ්ජාවෙ ඇඹරෙමින්
බිම බලන් යන්නෙ ඇයි...?

මහ මගේ බොහෝ අය මගෙන්
ඒ පැනය මගින් මග අහනවා...

"තරු පෙනෙන හින්දා"
මා එහෙම ඒ අයට කියනවා...

තරු තිබෙන්නේ ආකාස ගඟුලේ...
උඩ බැලූවොතින් පමණාමයි එය
පෙනෙන්නේ...
පෙරලා ඒ අයම දෙවෙනි පැනයත්
නගනවා....

උපන් ගෙයි පටන් තරු පෙනුන හින්දා
බිම බලන් යනවා බය දැනෙන හන්දා.....

## මරේ ඩාලින්
සමන් කුලරත්න

ලියු කවියෙන් සිත මුදාගත් වන්ගියේ
ඔබව දුටුවා සිනාසෙනවා නංගියේ
නෙත් සිහින්කර ගැටී තිබුනා දුම්රියේ
නුඹව පුරුදුයි කෙසේදැයි නැත නිච්චියේ

අතින් අත ගොස් ඉකි නොබිදිනා හන්දියේ
පහන් අඳුරට පාර කිවු පෙම්වන්තියෙ
පුරහනක් සේ රුසිරු විකුණන වෙන්දේසියේ
මාරේ ඩාලින් ගඟත් හරියට නුඹ වගේ

සියලු දුක් ඉවසමින් ගලනා සන්දියේ
ඉවුරුදැලට හිනැහුණා කහ කොළ පිච්චියේ
ගැඹුර සොයනෙමි පුරුදු ලෙෂ සංසාරයේ

## මහ වැස්ස
නලීන් කුලසේකර

එක දිගට මහ වැස්ස
ගුගුරමින් කළු අහස
දුක් සුසුම් දිව යන
ඒ වැස්සෙ තෙමෙන්නට
එන්න ඔබ මා එක්ක.

## සුන්දර ගමක සිට......
ජගත් වෙත්තසිංහ

නොකිලිටි සොබා දහමෙහි ඇති සුවද ගැමි
නෙත සිත සනසවන ගුණයට වසග වෙමි
විසිතුරු චමත්කාරය පිළිබදව හිමි
මහදේ උතුම් සම්මානය ඔබට දෙමි

ඇල දොළ ගලයි බිද නිසසල ගතිය වනේ
සීගිරි සිරස පිදුරංගල දුරට පෙනේ
මෙම ගම් පියස මට පවසන සොදුරු සෙනේ
මා ලද මහගු පිනැකැයි හදවතට දැනේ

ගහ කොළ මුලක අගනා ඔසු ගුණය නිති
මෙම පින් බිමෙහි ඇති විස්කම් අතර වෙති
දස්කම් හදාරන හෙළ වෙදකමෙහි ඇති
ලොව නන් පිරිස් නිබදව මෙම ගමට එති

ගස් අතුපතර ඇත බැද ලොකු බමර වද
මොනරුන් පියාඹායයි තුරු මුදුන හිද
හිම්දිරි උදය ලාහිරු රැස් අතර හිද
සියොතුන් නගයි තරගෙට මෙන් මියුරු නද

හෙළ වෙදකමින් ගත සිත සුවය සැලසුවේ
මෙම පින් බිමෙනි දහසක් සතන් සැනසුවේ
ගහකොළ වලට තම පණ මෙන්ය සැලකුවේ
ඉපැරණි රහස් ඔසු පැල තවම මෙහි වැවේ

ගුණේ පිරුණු අව්සද තුරුවැල ගහණ
ගෙනේ සුවය නිසැකව රෝ දුක නහන
ගෙනේ නිබද හදවත වෙත සුව සහන
පෙනේ ඈත රිටිගල කදු රජ දහන

දිවයන තරග රළපෙළ වැව් දියෙහි සැදී
සද කොමලියට මුමුණයි රස මියුරු පැදී
රස කුමුදුනිය සුපිපී සද කිරණ වැදී
මැදියම් රැයේ මගෙ තනිකම සමග හිදී

පින් පෙත් පුදා නිතරම නමදින දෙව්දු
ජන ජීවිතය වෙත දිවි ගතවන දිළිදු
පිහිටක් ලබන අය නොදකින ලෙස අවිදු
සිහිපත් කළා මට බැද්දේගම සිළිදු

හේනක පැලක ඉද උස අතු අතර සෙමින්
වන අලි ඇතුන් යනු දැක අතු රිකිලි කමින්
පලුගස්වැවෙ අති සුන්දර ගමෙහි නමින්
අමතක නොවෙයි මා ගත කළ යුගය පෙමින්

## හැරී නොබලන්
පද්මා රත්නායක සගා නගරය ජපානය

හැරී නොබලා යලිත් පිටුපස - ජීවිතේ මග පිය නගන්නේ
වැරදි වූ තැන් සොයා පල නැත - අතීතය නැත නැවත එන්නේ

පියවි ලෝකය පාළු වී ඇත - හද දවන දුක් ගින්න මත්තේ
හිතේ සැනසුම සොයා යාමට - සිහින ලෝකය පමණි ඇත්තේ

සිහින ලොව වෙත ලොබ කරන සිත - තදින් ඒ දෙස ඇදී යන්නේ
දිවිය සුරකින බලය ඇති මුත් - අනාගතයන් නැත පෙනෙන්නේ

සිහින මැද සිටිනවා නම් - තවම මා ඉන් අවසි වී නැත
දැවුනු හද ඉන් සතුටු වේ නම් - අවදි වන්නට සිතක්වත් නැත

## අපිට වෙච්ච දෙයක්
ආනන්ද ගුණතිලක - හොපර්ස් ක්‍රොසිං

රට - ජාතිය සමග ආගම රකින එක
වගකීමක් මෙන්ම හැමගෙම යුතුක මෙක
ඒ ගැන නොසිතෙනා දරුවන් වදපු එක
පිලිබඳ තැවෙති මව්වරු - තද කරන් දුක

දීලා ඉඟුරු අරගෙන සැර මිරිස් ටිකක්
අපෙ මව් බිමට අද සිදු වෙන කරුම වැලක්
හිතුවද මුහුණ දෙන්නට අපි මෙහෙම කලක්
මෙය නිසැකවම පෙර භවයක කරපු පවක්

ආනන්තරිය පාපෙකි මහ සඟ බේදේ
බුදු බණ තුලින් පැවසූ කරුණකි ඒ දේ
සමහර සාදුලා අද එලිපිට වාදේ
'සාදු' කිය කියා - අපි පතුරමු නාදේ

ගෝඨා - සිරිසේන දෙන්නා මරන් නට
මරලා ඒක කොටි ගිණුමට දමන් නට
ඞී අයි ජී කෙණෙක් යොදවපු උතුම් රට
අපෙ මව් බිමයි - බලතල ගිය ගොනුන් හට

වෙදෙකුගෙ අගය වැටහෙයි ලෙඩ හැදු නාම
ඒ වනතුරු වසයි හැම වෙද ඇදු රාම
වෛරය මතින් රට යන 'මළගම් යෑම'
නවතා ලන්න කටයුතු කරමුද කෝම?

